සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 8 - 2017

**නම : ..............................................** **භූගෝල විද්‍යාව** **කාලය : පැය 02 යි.**

## I කොටස

g **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

g **අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සූර්යයාගේ මතුපිට උෂ්ණත්වය නිවැරදිව දක්වෙන පිළිතුර කුමක් ද?
(i) $2000^0$C (ii) $6000^0$C
(iii) $3000^0$C (iv) $2800^0$C

(2) සෞරග්‍රහ මණ්ඩලයේ පිහිටි, මතු පිට උෂ්ණත්වය අධික ම ග්‍රහ ලෝකය වන්නේ මින් කවරක් ද?
(i) සිකුරු ය. (ii) අඟහරු ය.
(iii) බ්‍රහස්පති ය. (iv) බුධ ය.

(3) ක්‍රි. ව. 1610 දී විශ්වය නිරීක්ෂණය සඳහා දුරදක්නය මුලින් ම භාවිතා කළ පුද්ගලයා වන්නේ මින් කවරෙක් ද?
(i) නිකලස් කොපර්නිකස් (ii) අයිසැක් නිව්ටන්
(iii) ගැලීලියෝ ගැලිලි (iv) ක්ලෝඩියස් ටොලමි

(4) සෙරිස් සහ හෝමියා යන ග්‍රහලෝක පිළිබඳ ව නිවැරදිම ප්‍රකාශය මින් කවරක් ද?
(i) ග්‍රහලෝක වටා කක්ෂගතව පරිභ්‍රමණය වේ. (ii) පරිවාර ග්‍රහයින් ලෙස පවතී.
(iii) නිශ්චිත කක්ෂ තලයක් හඳුනාගත නොහැකි ය. (iv) සූර්යයාට ආසන්නව ම පිහිටා ඇත.

(5) ඉස්ලාමාබාද් අගනුවර වන්නේ මින් කවර රටක ද?
(i) ඉන්දියාව (ii) බංග්ලාදේශය
(iii) පාකිස්ථානය (iv) නේපාලය

g **අංක 6 - 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා ඒවා නිවැරදි නම් '3' ලකුණ ද වැරදි නම් 'x' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) බුධ සූර්යයාට ආසන්නව පිහිටා ඇති අතර සෞරග්‍රහ මණ්ඩලයේ කුඩා ම ග්‍රහ ලෝකය ද වේ. ( )

(7) පෘථිවි භ්‍රමණයේ ප්‍රතිඵලයක් ලෙස දිවා සහ රාත්‍රී කාලය ඇති වේ. ( )

(8) මුළු පෘථිවි තලයෙන් 75%ක් ජලයෙන් වැසී ඇත. ( )

(9) සමකයට සමාන්තර උතුරු අක්ෂාංශ $90^0$ දක්වා ප්‍රදේශය හඳුන්වන්නේ නැගෙනහිර අර්ධ ගෝලය වශයෙනි. ( )

(10) 'නිකොබාර් දූපත' දකුණු ආසියානු භූගෝලීය ප්‍රදේශයට අයත් වේ. ( )

g අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.

(11) සෞරග්‍රහ මණ්ඩලයේ වැඩිම උපග්‍රහයන් සිටින, අධිකතම ගුරුත්වාකර්ෂණ බලයක් ඇති ග්‍රහලෝකය ................................ වේ.

(i) සෙනසුරු (ii) බුධ

(iii) බ්‍රහස්පති (iv) අඟහරු

(12) දකුණු ආසියානු කලාපයේ රටවල් අතරින් ........................................ වෙරළ තීරයක් හිමි නැති රටවල් දෙකකි.

(i) පාකිස්ථානය හා නේපාලය (ii) නේපාලය හා භූතානය

(iii) ඉන්දියාව හා භූතානය (iv) මාලදිවයින හා නේපාලය

(13) ශ්‍රී ලංකාවේ උතුරේ පේදුරු තුඩුවේ සිට දකුණේ දෙවුන්දර තුඩුව දක්වා දුර කිලෝමීටර ............................................ කි.

(i) 342 (ii) 432

(iii) 232 (iv) 224

(14) ග්‍රිනිච් වේලාව දහවල් 12.00 වන විට නැගෙනහිර දේශාංශ $30^0$ වේලාව වන්නේ මින් කුමක් ද?

(i) ප. ව. 1.00 (ii) ප. ව. 2.00

(iii) පෙ.ව. 11.00 (iv) පෙ. ව. 10.00

(15) සාර්ක් සංවිධානයේ සාමාජිකත්වය හිමි වී ඇති ඇෆ්ගනිස්ථානය භූගෝලීය වශයෙන් අයත් වන්නේ, ............................. කලාපයටයි.

(i) දකුණු ආසියානු (ii) නැගෙනහිර ආසියානු

(iii) මධ්‍යම ආසියානු (iv) අග්නිදිග ආසියානු

g අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

(16) මුලින් ම සඳ මත පා තැබුවේ .................................... ය.

(17) 'දකුණු ආසියානු කලාපයේ' ජනගහනය අධිකම රට ..................................... වේ.

(18) තැනිතලා බිමක පිහිටි කොතක හැඩ ගන්නා කුඩා උස්බිමක් ............................ ලෙස හැඳින්වේ.

(19) සූර්ය විකිරණයේ ඇති ජීවීන්ට අහිතකර පාරජම්බුල කිරණ අවශෝෂණය කර ගැනීම ........................................ ස්තරය මගින් සිදු වේ.


(20) උත්තර ධ්‍රැවය සහ දක්ෂිණ ධ්‍රැවය සම්බන්ධ කරමින් නිර්මාණය කර ඇති කල්පිත රේඛා ජාලය .................................... ලෙස හඳුන්වයි.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

g **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

(01) සෞරග්‍රහ මණ්ඩලයේ පින්තූරය හොඳින් නිරීක්ෂණය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) අංක 1 සිට 8 දක්වා රූප සටහනේ දක්වෙන සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහලෝක නම් කරන්න. (ලකුණු 4)

(ii) සූර්යයාගේ විශේෂ ලක්ෂණ 2ක් ලියන්න. (ලකුණු 2)

(iii) අංක 5 හා 8 ග්‍රහලෝකවල පවතින කැපී පෙනෙන ලක්ෂණ 2ක් දක්වන්න. (ලකුණු 4)

(iv) දැනට හඳුනාගෙන ඇති වාමන ග්‍රහයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)

(v) සූර්යයාට ආසන්නම හා දුරින් ම පිහිටි ග්‍රහ ලෝක 2ක නම් කර එම පිහිටීම නිසා ඒවාට ඇති වී තිබෙන බලපෑම් 2ක් දක්වන්න. (ලකුණු 2)

(vi) අතීතයේ අභ්‍යවකාශ තොරතුරු ගවේෂණයේ යෙදුණු විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

(ලකුණු 2)

(2) ආසියා මහද්වීපයේ සුවිශේෂ භූගෝලීය කලාපයක් ලෙස දකුණු ආසියා ප්‍රදේශය දැක්විය හැකි ය.

(i) දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න.

උතුරින් -

දකුණින් -

නැගෙනහිරින් -

බටහිරින් - (ලකුණු 2)

(ii) දකුණු ආසියානු කලාපයේ රටවල් කිහිපයක් හා ඒවායේ අගනුවර A හා B කොටස්වලින් දැක්වේ. නිවැරදි පිළිතුර සොයා යා කරන්න.

| A | B |
|---|---|
| 1. පාකිස්ථානය | කත්මණ්ඩු |
| 2. මාලදිවයින | තිම්පු |
| 3. භූතානය | ඉස්ලාමාබාද් |
| 4. නේපාලය | නවදිල්ලිය |
| 5. ඉන්දියාව | මාලේ |

(ලකුණු 5)

(iii) දකුණු ආසියානු කලාපයේ විශාලතම රට නම් කර, දකුණු ආසියානු කලාපයේ විශේෂ ලක්ෂණ 3ක් ලියා දක්වන්න. (ලකුණු 4)

(03) (i) පෘථිවි ගෝලයේ එක් එක් සෘතු පිළිබඳ දී ඇති තොරතුරු හොඳින් කියවා, එම ප්‍රකාශ අයත් වන්නේ කිනම් සෘතුවට දැයි අදාළ කොටුව තුළ අක්ෂර යොදන්න.

පෘථිවියේ ප්‍රධාන සෘතු

| 1. ගිම්හාන සෘතුව | 2. සරත් සෘතුව | 3. ශීත සෘතුව | 4. වසන්ත සෘතුව |
|---|---|---|---|
| ......................<br>...................... | ......................<br>...................... | ......................<br>...................... | ......................<br>...................... |

A - උතුරු අර්ධ ගෝලයේ රටවල ජුනි හා දක්ෂිණ අර්ධ ගෝලයේ රටවලට දෙසැම්බර් මාසවල මෙම සෘතුව උදා වේ.

B - පරිසර උෂ්ණත්වය ක්‍රමයෙන් පහල යයි.

C - උෂ්ණත්වය අධිකය, ශාක හා සතුන්ට තරමක් අපහසු ය. දිගු දිවා කාලයක් ඇත.

D - රාත්‍රී කාලය දිගුය. බොහෝ ප්‍රදේශවල හිම පතනය සිදු වේ.

E - ශාකවල පත්‍ර හැලීම ආරම්භ වේ.

F - හිම හා අයිස් ක්‍රමයෙන් දිය වී යයි.

G - ශාක දළු ලා වැඩී මල් හා ඵල හට ගනී.

H - ශාක පත්‍ර සම්පූර්ණයෙන් ම හැලී යයි. (ලකුණු 8)

(ii) පෘථිවි පරිභ්‍රමණයේ ප්‍රතිඵල ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| දිනය | හිරු මුදුන් වීම | හඳුන්වන ආකාරය |
|---|---|---|
| 1. මාර්තු 21 | සමකයට | ........................................ |
| 2. ......................... | සමකයට | සරත් සූර්ය විෂුවය. |
| 3. දෙසැම්බර් 22 | මකර නිවර්තනය | ........................................ |

(ලකුණු 3)

(04) (i) පෘථිවියේ ජලය පවතින ප්‍රධාන ආකාර තුන නම් කරන්න. (ලකුණු 3)

(ii) පෘථිවිය මත ජලය ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුරු ලියා දක්වන්න.

1. සාගර හා මුහුදු - ................%

2. භූගත ජලය - ................%

3. අයිස් - ................%

4. මිරිදිය ජලය - ................% (ලකුණු 4)

(iii) විවිධ මානුෂ ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණයට ලක් වේ. එවැනි ක්‍රම 2ක් නම්කර, ඉන් එක් ක්‍රමයක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

(05) (i) පහත A කොටසේ දී ඇති ප්‍රකාශය හොඳින් කියවා ඊට අදාළ නිවැරදි පිළිතුර B කොටසින් සොයා යා කරන්න.

| A | B |
|---|---|
| 1. පෘථිවි ගෝලයේ උතුරේ සිට දකුණට විහිදී ඇති මනඃකල්පිත රේඛා | *අක්ෂාංශ |
| 2. පෘථිවිය උතුරු හා දකුණු අර්ධ ගෝල ලෙස දෙකකට බෙදෙන අක්ෂාංශ $0^0$ රේඛාව | *දේශාංශ |
| 3. නැගෙනහිර සිට බටහිරට විහිදී ඇති තිරස් මනඃකල්පිත රේඛා සමූහය | *සමකය |


(ලකුණු 3)

(ii) පෘථිවි භ්‍රමණය යනු කුමක් දැයි හඳුන්වා භ්‍රමණය නිසා ඇති වන ප්‍රධාන ප්‍රතිඵල 2ක් ලියා දක්වන්න.
(ලකුණු 4)

(iii) (a) පෘථිවිය දේශාංශ පදනම් කරගෙන සම්මත වේලා කලාප කීයකට බෙදා තිබේ ද? (ලකුණු 2)

(b) වැඩි දේශාංශ ප්‍රමාණයක ව්‍යාප්ත වී ඇති ලෝකයේ විශාල රටවල් වේලා කලාප කීපයකට අයත් වේ. එවැනි රටවල් දෙකක් නම් කරන්න.
(ලකුණු 2)

(06) සපයා ඇති තොරතුරු උපයෝගී කරගෙන පහත සඳහන් ප්‍රහේලිකාව පුරවන්න.



**පහළට**


1. ජීවීන්ගේ පැවැත්මට අත්‍යාවශ්‍ය සාධකයකි.
3. පෘථිවියේ දැකිය හැකි ප්‍රධාන ඍතුවකි.
5. ඉරබටු තරුව, පහන් තරුව යන නම්වලින් ද මෙම ග්‍රහයා හඳුන්වයි.
6. පෘථිවිය හඳුන්වන තවත් නමකි.
8. තාරකා විද්‍යා සංගමය දැනට සොයාගෙන ඇති වාමන ග්‍රහයෙකි.
10. ඉන්දියාවේ අගනුවරයි.

**හරහට**

2. දකුණු ආසියානු කලාපයේ රටකි.
4. ජීවීන්ගේ ශ්වසන ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය වායු වර්ගයයි.
7. අගහරු ග්‍රහයා මේ නමින් හඳුන්වයි.
9. පෘථිවිය මත 0.5% මෙම ජලය ව්‍යාප්තව ඇත.

11. ආලෝකය හා ශක්තිය නිකුත් කරන විශාලම තාරකාව මෙය වේ. (ලකුණු 11)

(07) දකුණු ආසියානු කලාපයේ සිතියමක් පහත දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) 1. ලොව උසින් වැඩි ම කඳු වැටිය පෙන්වීමට යොදා ඇති අක්ෂරය ලියන්න.

2. වාර්ෂිකව ගංවතුර උවදුරට ගොදුරු වන E අක්ෂරයෙන් පෙන්වා ඇති රට කුමක් ද?

3. නිතර ම ශ්‍රී ලංකාවට සුළං බලපෑම් ඇති කරවන B අක්ෂරයෙන් හැඳින්වෙන ස්ථානය නම් කරන්න.

4. දූපත් රාශියකින් සමන්විත වී ඇති දකුණු ආසියානු රට දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

5. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පිහිටි පටු මුහුදු තීරය D අක්ෂරයෙන් හඳුන්වා ඇත. ඒය හඳුන්වන නම ලියන්න. (ලකුණු 5)

(ii) දකුණු ආසියානු කලාපයේ පිහිටුවා ඇති දේශපාලන සංවිධානයක් නම් කරන්න. (ලකුණු 2)

(iii) ඉන්දියන් සාගරයට යාබද ව පිහිටි දකුණු ආසියානු කලාපයේ රටවල් 2ක් හා දූපත් 2ක් නම් කරන්න. (ලකුණු 4)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

## භූගෝල විද්‍යාව පිළිතුරු පත්‍රය

### I කොටස

(1) - (ii)

(2) - (iii)

(3) - (iii)

(4) - (iii)

(5) - (iv)

(6) - 3

(7) - 3

(8) - x

(9) - x

(10) - 3

(11) - බ්‍රහස්පති

(12) - නේපාලය හා භූතානය

(13) - 432Km

(14) - ප.ව. 2.00

(15) - මධ්‍යම ආසියාව

(16) - නීල් ආම්ස්ට්‍රෝන්

(17) - ඉන්දියාව

(18) - කොත්කන්ද

(19) - ඕසෝන්

(20) - දේශාංශ

(ලකුණු 2 x 20 = 40)

### II කොටස

(01) (i) සූර්යයා, බුධ, සිකුරු, පෘථිවි, අඟහරු, බ්‍රහස්පති, සෙනසුරු, යුරේනස්, නෙප්චූන්

සූර්යයා, ග්‍රහලෝක, වාමන ග්‍රහයන්, උපග්‍රහයන් (ලකුණු 2)

(ii) *සූර්යයා තම අක්ෂය වටා භ්‍රමණය වේ.

*පෘථිවිය මෙන් 109 ගුණයක් විශාලයි.

*සෞරග්‍රහ මණ්ඩලයේ සියලු ම ග්‍රහලෝකවලට ශක්තිය හා තාපය ලබාදේ.

*සූර්යයාගේ මතුපිට උෂ්ණත්වය $6000^0C$ පමණ වේ. (ලකුණු 2)

(iii) 1. අභ්‍යන්තර ග්‍රහ ලෝක (බුධ, සිකුරු, පෘථිවි, අඟහරු)

2. බාහිර ග්‍රහලෝක (බ්‍රහස්පති, සෙනසුරු, යුරේනස්) (ලකුණු 4)

(iv) ඒරිස්, ප්ලූටෝ, සෙරිස්, හෝමියා (ලකුණු 2)

(v) බුධ, නෙප්චූන් (ලකුණු 2)

(vi) ක්ලෝඩියක් ටොලමි, නිකොලස් කොපර්නිකස්, ජොහැන්නස් කෙප්ලර් (ලකුණු 4)

(02) (i) උතුරින් - හිමාල කඳු පංතිය

දකුණින් - ඉන්දියන් සාගරය

නැගෙනහිර - බෙංගාල බොක්ක

බටහිර - අරාබි මුහුද (ලකුණු 2)

(ii) පාකිස්ථානය - ඉස්ලාමාබාද්

මාලදිවයින - මාලේ

භූතානය - තිම්පු

නේපාලය - කත්මණ්ඩු

ඉන්දියාව - නවදිල්ලිය (ලකුණු 5)

(iii) ඉන්දියාව

විශේෂ ලක්ෂණ

*මෙම කලාපයේ අධික උෂ්ණත්වය මෙන්ම අධික සීතල ප්‍රදේශ ද පිහිටා තිබීම.

*භූ විෂමතා විවිධත්වය පෙන්නුම් කරයි.

*සමස්ත පෘථිවි තලයෙන් 3%ක භූමි ප්‍රදේශයක් මෙම කලාපයට අයත් වේ.(ලකුණු 4)

(03) (i) 1 - A, C 2 - B, E 3 - D, H 4 - F, G (ලකුණු 2 x 4 = 8)

(ii) 1. - වසන්ත සූර්ය විෂුවය

2. - සැප්තැම්බර් 23

3. - සිසිර සූර්ය නිවෘත්තිය (ලකුණු 3)

(04) (i) ද්‍රව, ඝන, වාෂ්ප (ලකුණු 3)

(ii) 1. - 97%

2. - 1.75%

3. - 1.75%

4. - 0.5% (ලකුණු 4)

(iii) *කර්මාන්තශාලාවලින් පිටවන අපද්‍රව්‍ය ජලයට මුසු කිරීම.

*පරිවහන කටයුතු නිසා අපද්‍රව්‍ය ජලයට එක්වීම

*කෘෂි රසායන ද්‍රව්‍ය වැඩිපුර භාවිත කිරීම.

(කරුණු 2ට ලකුණු 02යි. විස්තර කර ඇත්නම් ලකුණු 02යි)

(05) (i) 1 - දේශාංශ 2 - සමකය 3 - අක්ෂාංශ (ලකුණු 3)

(ii) හැඳින්වීමට (ලකුණු 2)

ප්‍රතිඵල 2 සඳහා (ලකුණු 2)

(iii) (a) 24 (ලකුණු 2)

(b) ඇ.එ.ජ., කැනඩාව, රුසියාව, ඕස්ට්‍රේලියාව (ලකුණු 2)

(06)

| **පහලට** | **හරහට** |
|---|---|
| 1. ජලය | 2. මාලදිවයින |
| 3. වසන්ත | 4. ඔක්සිජන් |
| 5. සිකුරු | 7. රතු ග්‍රහයා |
| 6. නිල්ග්‍රහයා | 9. මිරිදිය |
| 8. හෝමියා | 11. සූර්යයා |
| 10. නවදිල්ලිය | |

(ලකුණු 1 x 11 = 11)

(07) (i) 1. A 2. බංගලාදේශය 3. බෙංගාල බොක්ක

4. මාලදිවයින 5. පොක් සමුද්‍ර සන්ධිය (ලකුණු 5)

(ii) සාර්ක් සංවිධානය (ලකුණු 2)

(iii) ශ්‍රී ලංකාව, ඉන්දියාව, මාලදිවයින ...

නිකොබාර් දූපත්, අන්දමන් දූපත් .... (ලකුණු 4)